**බේරුවල නගර සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**
**--------------------**

**1.** මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජූනි 30 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 23 දින ද සභාපතිවරයාට යවා ඇත**.**

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බේරුවල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයට අදාල පුනරාවර්තන ආධාර හා ලැබිය යුතු ආදායම් රු.255,000 කින් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කල යුතුවේ. | 2019 වර්ෂයේ නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කරමි. |
| (ii) | 2018 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පත් වටිනාකම රු.1,391,581 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | 2019 වර්ෂයේ නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කරමි. |
| (iii) | ට්‍රැක්ටර් වාරිකය සඳහා සමාලෝචිත වර්ෂය තුළ මුද්දර ගාස්තුවලින් අඩුකල මුදල රු.1,368,750 ක් වුවත් ,ලැබිය යුතු මුද්දර ගාස්තු ගිණුමට ගලපා තිබුණේ රු.1,053,937 ක් පමණි. ඒ අනුව | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | නිවැරදිව ගිණුම්ගත කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | රු.314,813 කින් ලැබිය යුතු මුද්දර ගාස්තු, පළාත් සභා ණය හා අයකර ගත හැකි උපයෝගි සේවා වැඩියෙන්ද , ප්‍රාග්ධන වියදම් අඩුවෙන් ද දක්වා තිබුණි. | | |
| (iv) | තොග වටිනාකම ලෙස භෞතික තොගය ගිණුම්ගත කිරිම වෙනුවට රු.3,941,016 ක් වු පොත් අගය ගිණුම්ගත කර තිබුණි. | භෞතික තොගය ගිණුම්ගත කල යුතුවේ. | ඉදිරියේදී නිවැරදි ගිණුම්ගත කිරිමට කටයුතු කරමි. |
| (v) | ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය සමාන වියයුතු වුවත්, එම ගිණුම් දෙක අතර රු.451,702 ක වෙනසක් විය. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුමින් නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (vi) | 2015 වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු රු.390,000 ක් වු ට්‍රේලර් දෙකක වටිනාකම හා අත් ට්‍රැක්ටරයක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුමින් නිවැරදි කිරිමට කටයුතු කරමි. |

(ආ) නොසැසදුණු ගිණුම්

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන් දිමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම් විෂයයන් 08 කට අදාල රු.57,163,616 ක් ශේෂයන් හා ඒවාට අදාල උප ලේඛන වල දැක්වෙන ශේෂයන් අතර රු.9,427,483 ක වෙනසක් විය. | අදාල ශේෂ වල වෙනස් කම් සසදා ගිණුම් නිවැරදි කිරිමට කටයුතු කල යුතුවේ. | 2019 අවසන් ගිණුම සකස් කිරිමේදි නිවැරදිව ඉදිරිපත් කිරිමට කටයුතු කරමි. |

(ඇ) අවිනිශ්චිත ගිණුම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ රු.444,419 ක බැර ශේෂයක් තිබුණු අතර , එය හදුනාගෙන නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතුවේ. | ඉදිරි ගිණුම් වර්ෂයේදි අවිනිශ්චිත ගිණුම නිවැරදි කරමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, විස්තරාත්මක උපලේඛන හා ශේෂ තහවුරු කිරීමේ ලිපි නොමැති වීම නිසා රු.74,376,389 ක් වූ ගිණුම් විෂයයන් 09 ක් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | 2019 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | 1988 නගර සභා ආඥා පනත 170 (2) වගන්තිය | - | හිඟ වරිපනම් බදු අයකර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපල තහනම් කිරීම් කර නොතිබුණි. | නගර සභා ආඥා පනත අනුව කටයුතු කල යුතුවේ. | රතු නිවේදන නිකුත් කර දේපල තහනම් කිරීම ක්‍රියා මාර්ග දක්වා කටයුතු කරමින් පවතී. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | | |
| | (i) මුදල් රෙගුලාසි 371(2)(ඇ) | 1,087,611 | කිසියම් කාර්යයක් සඳහා දෙන ලද අත්තිකාරම් මුදලක් අදාල කාර්ය නිම වූ වහාම පිය විය යුතු වුවත් එසේ කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | 2019 වසරේ අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරමි. |
| | (ii) මුදල් රෙගුලාසි 571(1)(2) | 1,669,388 | සෑම අර්ධ වර්ෂයකම අවසානයේදී කල් ඉකුත් වූ සියලුම තැන්පතු පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | කල් ඉකුත් වූ තැන්පත් ඉදිරියේදි ආදායමට ගැනිමට කටයුතු කරමි. |

රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.33,233,072 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.32,574,806 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 16,336,400 | 16,908,314 | 10,531,001 | 19,668,035 | 17,297,400 | 16,784,174 | 8,565,171 | 18,526,775 |
| (ii) | කුලී | 19,870,600 | 11,149,153 | 8,971,404 | 2,177,749 | 19,973,000 | 13,031,737 | 11,443,624 | 1,588,112 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 510,000 | 216,755 | 216,755 | - | 160,000 | 192,750 | 170,000 | 22,750 |
| (iv) | වෙනත් ආදායම් | 210,000 | 125,875 | 125,875 | - | 135,000 | 485,812 | 485,812 | - |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 ජනවාරි 01 දිනට සභාවේ හිඟ වරිපනම් බදු ශේෂය රු.18,372,695 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළදී ඉන් රු.13,290,721 ක් හෙවත් සියයට 72 ක් අයකර නොතිබුණි. | හිඟ වරිපනම් ආදායම අයකර ගත යුතුවේ. | ඉදිරියේදී හිඟ වරිපනම් ආදායම රැස් කිරීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (ආ) වාර්ෂික බිල් කිරීම රු.15,262,394 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රු.6,299,414 ක් හෙවත් සියයට 41 ක් අයකර ගෙන නොතිබුණි.2019 මැයි 31 දින වන විට මුළු වරිපනම් බදු හිඟය රු.16,454,579 ක් විය. | හිඟ වරිපනම් ආදායම අයකර ගත යුතුවේ. | වර්ෂය තුල ක්‍රියාත්මක සැලැස්මක් අනුව හිඟ අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) 2018 දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු හිඟය වර්ෂ 01 ට අඩු රු.2,823,702 ක්ද, වර්ෂ 01-03 අතර රු.4,103,787 ක්ද , වර්ෂ 03-05 අතර රු.7,483,962 ක්ද , වර්ෂ 05-10 අතර රු.3,903,792 ක්ද හා වර්ෂ 10 ට වැඩි රු.1,274,892 ක්ද විය. දීර්ඝ කාලීනව වරිපනම් අය නොවන දේපල සම්බන්ධයෙන් නගර සභා ආඥා පනතේ 170 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් ආදායම අයකර ගත යුතුවේ. | ඉදිරියේදී දේපල තහනම් කිරීමේ කටයුතු සිදු කරන බව දන්වමි. |
| (ඈ) රාජ්‍ය ආයතනවලින් ඒකක 39 කට අදාලව 2018 දෙසැම්බර් 31 වන විට වර්ෂ 03 ඉක්මවූ හිඟ ශේෂය රු.206,490 ක් විය. | හිඟ වරිපනම් ආදායම අයකර ගත යුතුවේ. | පළාත් පාලන කොමසාරිස් වෙත අවශ්‍ය කටයුතු සඳහා යොමු කර ඇති බව දන්වා සිටිමි. |
| (ඉ) සභාවේ අනුමත ගොඩනැගිලි හා දේපල සඳහා නව තක්සේරු වටිනාකම් ලබාගෙන වරිපනම් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | නව තක්සේරු වටිනාකමක්ලබාගෙන වරිපනම් අය කිරීමට කටයුතු කල යුතුවේ. | 2019 වර්ෂයේ කෙරෙමින් පවතින නව තක්සේරු ප්‍රතිශෝධනයේදී එම දේපල සඳහා නව තක්සේරු ලබා ගැනීමට කටයුතු කරමි. |

3 මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 කාර්ය සාධනය
------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අතුරු ව්‍යවස්ථා<br>------------------<br>නගර සභා පනතේ 157 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 15 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 04 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි. | නගර සභා පනත අනුව අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතුවේ. | අතුරු ව්‍යවස්ථා 14 ක් 2016 දෙසැම්බර් 28 වන දින පළාත් සභා අති විශේෂ ගැසට් පත්‍ර යේ පළ කර වැළඳගෙන ඇත. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

| | | |
|---|---|---|
| ක්‍රියාකාරි සැලැස්මේ වැඩ සටහන් 05 ක් වෙනුවෙන් රු.මි.114.57 ක පිරිවැය වූ ක්‍රියාකාරකම් 110 ක් ඉටුකර ගැනීමට හඳුනාගත්තද ප්‍රගතිය මැන බැලීමේ ක්‍රම වේදයක් සභාව සතුව නොතිබුණි. | අදාල චක්‍රලේඛ ප්‍රකාරව නිවැරදිව ක්‍රියාකාරි සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කල යුතුවේ. | ඉදිරියේදි ක්‍රියාකාරි සැලැස්මේ ප්‍රගතිය මැන බලන වෙනත් ක්‍රමවේදයකට යොමු වීමට බලාපොරොත්තු වන බව දන්වා සිටිමි. |

(ඇ) ප්‍රතිපාදන නොසැලසීම

| | | |
|---|---|---|
| අයවැය ලේඛනයෙන් භෞතික සැලසුම් වැඩ සටහන් යටතේ ප්‍රාග්ධන ප්‍රතිශත රු.මි.13.07 ක් ඇති කළද , වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම තුල ව්‍යාපෘති 26 ක් වෙනුවෙන් රු.මි. 25.89 ක ඇස්තමේන්තු සකස් කර තිබුණි. ඒ අනුව රු.මි.12.82 ක් වෙනුවෙන් අයවැය ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ප්‍රශස්ථ අයුරින් අයවැය ලේඛනය පිළියෙල කිරිමට කටයුතු කල යුතුවේ. | 2020 වර්ෂයේ සිට අයවැය සකස් කිරිමේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරමි. |

(ඈ) ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරිම

| | | |
|---|---|---|
| ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් පිරිවැය රු.මි.22.79 ක් වූ ව්‍යාපෘති 20 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ප්‍රශස්ථ අයුරින් ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතුවේ. | 2020 වර්ෂයේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරමි. |

(ඉ) ක්‍රියාකාරි සැලැස්මට පරිභාහිර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් නොවූ පිරිවැය රු.මිලියන 15.69 ක් වූ ව්‍යාපෘති 35 ක් ක්‍රියාත්මක කර තිබුණි. | ප්‍රශස්ථ අයුරින් ක්‍රියාකාරි සැලැස්ම සකසා එම සැලැස්මට අනුව කටයුතු කලයුතුවේ. | 2020 වර්ෂයේ සිට ක්‍රියාකාරි සැලැස්මට පරිභාහිර ව්‍යාපෘති කරන්නේ නම් ඒ වෙනුවට සංශෝධිත සැලැස්මක් ඉදිරිපත් කරන බවත් මින් ඉදිරියට ක්‍රියාකාරි සැලැස්මට පරිභාහිර ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීමට කටයුතු කරන බවත් දන්වමි. |

(ඊ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා කසළ කළමණාකරණය වෙනුවෙන් සභාව විසින් රු.32,018,486 ක වියදමක් දරා තිබූ අතර කසල අතර කසල බඳු පැනවීමෙන් ලද ආදායම රු.641,500 ක් විය. එතෙන් කසල | දිරන කසල කොම්පෝස්ට් කිරීමට අවධානය යොමු විය යුතුයි. | කොම්පෝස්ට් ව්‍යාපෘතියක් සඳහා යොමුවීමට නොහැකි වේ. |

| | | |
|---|---|---|
| බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | | |
| (උ) තිරසර සංවර්ධන ඉලක්ක<br>---------------------------- | | |
| ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2017 ජූලි 31 දිනැති අංක BD/CBP/4/1/2-2018 දරන චක්‍රලේඛය අනුව අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී එම චක්‍රලේඛයෙන් හඳුන්වා දී ඇති නව ප්‍රතිපත්ති උපාය මාර්ග පදනම් කර ගෙන නොතිබුණි. | අදාල චක්‍රලේඛ මඟපෙන්වීම් වලට අනුව කටයුතු කල යුතුවේ. | හා 2019 වර්ෂයේදී මෙම ක්‍රියාව නිවැරදිව සිදු කර ඇත. |

3.2 මානව සම්පත් කළමනාකරණය
--------------------------------------

| විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>------------ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>---------------------- |
|---|---|---|
| (අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත<br>-----------------------------<br>ලේකම්, ගණකාධිකාරී හා පරිපාලන නිලධාරි යන තනතුරු පුරප්පාඩු වී පැවති අතර, ආදායම් පරික්ෂක තනතුරු 03 ක හා වැඩ පරික්ෂක තනතුරු 02 කද පුරප්පාඩු පැවතුණි | කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනිමට කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති. |
| (ආ) සේවක ණය<br>--------------<br>සමාලෝචිත වර්ෂය අවසානයට සේවය හැර ගිය , මියගිය , ස්ථාන මාරු වී ගිය හා විශ්‍රාම ගිය , නිලධාරින් 83 දෙනෙකුගෙන් අය නොවන රු.185,329 ක හිඟ ණය ශේෂයක් විය. | කඩිනමින් හිග ණය ශේෂ අයකර ගත යුතුවේ. | අවුරුදු 10 ට වැඩි හිඟ ණය ශේෂ කපා හැරිමට පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇත. ඉතිරි ණය ශේෂය ඉදිරියේදීඅය කර ගැනිමට කටයුතු කරමි. |

3.3 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ හිටපු නිලධාරිනියක විසින් ලබාගෙන ආපසු භාර දී නොතිබූ රු.26,400 ක් වටිනා කොඩි කණු 16 ක හා LED බල්බ් වැල් 24 ක වටිනාකම අයකර ගෙන නොතිබුණි. | අයකර ගැනිමට කටයුතු කල යුතුවේ. | අලාභය අයකර ගැනිමට අදාලව විනය පරික්ෂණයක් පවත්වන ලෙස පළාත් පාලන සහකාර කොමසාරිස් , කළුතර වෙත දන්වා ඇත. |

3.4 ප්‍රසම්පාදනය

3.4.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව 2018 වර්ෂය තුළ රු.මි.25.89 ක් පිරිවැය වූ ව්‍යාපෘති 26 ක් ක්‍රියාත්මක කිරිම සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර නොතිබුණි. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කල යුතුවේ. | 2019 වර්ෂයේ සිට නිවැරදි පරිදි ප්‍රසම්පාදන සැලැස්ම අනුව කටයුතු කරමි. |

3.4.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සභාව විසින් තාර දමා සංවර්ධනය කර තිබූ මාර්ග සඳහා මාර්ගයේ ස්වභාවය හඳුනාගෙන ඒ අනුව මට්ටම් තීරණය කර නිර්මාණ සකස් කර අනුමැතිය ලබා ගත යුතු වුවද , ABC පිරවිය යුතු ස්ථාන හඳුනාගැනීමකින් තොරව ABC කියුබ් 53.42 ක් මිළදී ගෙන රු.129,290 ක් ගෙවීම් කර තිබුණි. | තාර දමා සංවර්ධනය කරන ව්‍යාපෘති සඳහා එක් එක් ව්‍යාපෘතිය වෙනුවෙන් නිර්මාණ සකස් කර අනුමැතිය ලබාගත යුතුවේ. | තාර දමා සංවර්ධනය කල ව්‍යාපෘති සඳහා දළ සැලසුම සකස් කර ඇත. |

| | | |
|---|---|---|
| (ආ) මාර්ග ඉදිකිරීම් වෙනුවෙන් භාවිත කළ ABC හි මිශ්‍රණ අනුපාතය පරීක්ෂණ වාර්තාවලින් තහවුරුවකින් තොරව මාර්ග ගාස්තු උපලේඛනයේ වැඩිරේටයන් භාවිත කර ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් රු.778,172 ක් ගෙවා තිබුණි. | ABC හි මිශ්‍රණ අනුපාතය පරීක්ෂණ වාර්තාවලින් තහවුරු කළ යුතුවේ. | සභාව වෙත සපයනු ලබන ABC සඳහා මේ වන විට මිශ්‍රණ අනුපාතය පරීක්ෂණ වාර්තාව පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය වෙතින් ලබා ගෙන ද්‍රව්‍ය භාවිත කිරීම සිදු කරයි. |
| (ඇ) සෘජු ශ්‍රමය මගින් තාර අතුරා මාර්ග සංවර්ධනය කිරිම සඳහා ඇස්තමේන්තු අනුව අමුද්‍රව්‍ය අවශ්‍යතාවය තීරණය කලයුතු වුවද නිකුත් කිරිමේ නියෝග අනුව ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් අමුද්‍රව්‍ය අවශ්‍යතාවයට වඩා රු.189,025 ක් වැඩියෙන්ද ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් රු.129,369 ක් අඩුවෙන් ද නිකුත් කර තිබුණි. | ඇස්තමේන්තු අවශ්‍යතාවය අනුව ද්‍රව්‍ය නිකුත් කළ යුතුවේ. | ඇස්තමේන්තුගත මාර්ගයේ පළල වැඩිවීම නිසා අමුද්‍රව්‍ය මෙලෙස භාවිතා කර ඇත. තවද තාර නිකුත් කිරිම අවශ්‍ය ප්‍රමාණයට අනුව සිදු කල නොහැකි වී ඇත. |
| (ඈ) කාපට් අතුරා සංවර්ධනය කර තිබූ මාර්ග 02 ක ABC ඝණකම හා කාපට් වල මිශ්‍රණ අනුපාතය පරික්ෂණ වාර්තාවලින් තහවුරු කර නොගෙන රු.13,693,365 ක් ගෙවා තිබූ අතර කාපට් ඇතිරූ එක් මාර්ගයක ඇස්තමේන්තු අනුව පැවතිය යුතු මි.මී.40 ඝණකමට වඩා අඩු මට්ටමක පැවතුණි. | ABC හා කාපට් මිශ්‍රණ අනුපාත පරීක්ෂණ වාර්තා වලින් තහවුරු කල යුතුවේ. | ව්‍යාපෘති වෙනුවෙන් ABC තැලීමට අදාල හා කාපට් ඝණකම පරික්ෂණ වාර්තා පමණක් සිදු කර ඇත. ඉදිරියේදී ABC ඝණකම හා මිශ්‍රණ අනුපාත පරික්ෂා කර වාර්තා ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. |
| (ඉ) වර්ග මීටර් 1,700 ක් වෙනුවෙන් කියුබික් මීටර් 68 කට ගෙවීම් කර තිබුණද පැලස් මාර්ගය කාපට් කිරිම භෞතික පරික්ෂාවේදී වර්ග මීටර් 1584 ක් සඳහා කියුබික් මීටර් 63.36 ක් කාපට් භාවිතා කර තිබුණි. වර්ග මීටර් 116 ක් වෙනුවෙන් cut back භාවිතා කර තිබුණු අතර එම ප්‍රමාණය හා එහි ඝණකම තහවුරුවකින් තොරව රු.115,336 ක් ගෙවීම් කර තිබුණි. | වර්ග මීටර් 116 ක් වෙනුවෙන් භාවිතා කල cut back ප්‍රමාණය හා එහි ඝණකම තහවුරු කල යුතුවේ. | මෙ සම්බන්ධයෙන් දැනුමක් ඇති ඉංජිනේරුවන් 03 විසින් ගෙවීම් සහතික කිරිම කරන ලදී. |
| (ඊ) සමඩ් මාවතේ තිබිය යුතු කාපට් ඝණකමට වඩා අඩුව පැවති මීටර් 65 ක ප්‍රමාණයක් සඳහා කොන්ත්‍රාත්කරුට රු.66,505 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | කාපට් ඝණකම පරික්ෂා කර වැඩිපුර ගෙවීම් අයකල යුතුවේ. | ඉංජිනේරුවන් 03 දෙනෙකු විසින් සහතික කරන ලද අතර ඒ සම්බන්ධයෙන් ඔවුන් වගකියනු ලැබේ. |